# පුරප්පාඩු

## ජ්‍යෙෂ්ඨ සහකාර කම්හල් නිලධාරි තනතුර

**වසර 30 පුරා තේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ විශිෂ්ඨයකු ලෙස නම් දරා සිටින සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ ජ්‍යෙෂ්ඨ සහකාර කම්හල් නිලධාරි සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**සුදුසුකම් හා පළපුරුද්ද**

| බාහිර අයදුම්කරුවන් | අභ්‍යන්තර අයදුම්කරුවන් |
|---|---|
| අධ්‍යන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී විෂයන් 04 කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයන් හයකින් (06) සමත්වීම (සිංහල/දෙමළ හා ගණිතය විෂයන් ඇතුළුව).<br>හෝ<br>තේ කර්මාන්ත ක්ෂේත්‍රයෙහි වසර 10 ක පළපුරුද්දක් තිබීම හා ඉන් අවම වශයෙන් වසර 03 ක් අදාල තනතුරෙහි හෝ සහකාර කම්හල් නිලධාරී හෝ ඒ හා සමාන තනතුරක සේවා පළපුරුද්දක් සමඟ සතුටුදායක සේවා කාලයක් තිබීම.<br><br>NIPM ආයතනය මගින් පවත්වනු ලබන ICFO - IC 02 ( Induction Course for Tea Factory Officers) හෝ NCTF – CC - 04 (National Certificate in Tea Manufacture & Factory Management Examination) පාඨමාලාව හදාරා තිබීම, අධ්‍යන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) සමත්ව තිබීම, ERP System සමඟ කටයුතු කිරීමේ හැකියාව විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ. | බාහිර සුදුසුකම් හෝ සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ සහකාර කම්හල් නිලධාරි හෝ සමාන තනතුරක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි වසර පහකට (05) නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |

**වයස**

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

| මාසික වැටුප් පරිමාණය | අනෙකුත් වරප්‍රසාද |
|---|---|
| 2022/25 සාමුහික ගිවිසුමට අනුව<br>රු. 38,440.00 3 x 1,125.00 - 41,815.00 (2025) | • වාර්ෂික ප්‍රසාද දීමනා<br>• ආකර්ශනීය වෛද්‍ය රක්ෂණාවරණයක් (පවුලේ සාමාජිකයින් ඇතුළුව)<br>• සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල්<br>• මාසික තේ කොළ දීමනාව<br>• සේවකයින් වෙත ලබා දෙන අනෙකුත් දීමනා සහ වරප්‍රසාද |

ඔබගේ අයදුම්පත ජීව දත්ත සමඟ අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කල හැකි සහතිකවල පිටපත් සමඟ ඉදිරිපත් කළ යුතුය

තවද, දැනටමත් රජයේ, සංස්ථා, මණ්ඩලවල සේවයේ යෙදිසිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.

සෑම අයදුම්කරුවෙක්ම මනා ශරීර සෞඛ්‍යකින් හා ධනාත්මක අදහස්වලින් පිරි ක්‍රියාශීලි අයෙකු විය යුතු අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ හැකියාව තිබිය යුතුය.

ගාල්ල, මාතර, මහනුවර දිස්ත්‍රික්ක වල පදිංචි පිරිමි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.

තෝරා ගැනීම සඳහා කිනම් අයුරකින් හෝ අනිසි බලපෑම් කිරීම නුසුදුසුකමට හේතු වනු ඇති අතර, අධ්‍යක්ෂක මණ්ඩල තීරණය අවසාන තීරණය වේ.

ඉහත සුදුසුකම් සපුරා ඇති ඔබගේ ආදර්ශ ආකෘතියට (kalubowitiyanatea.lk වෙබ් අඩවියෙන් බාගත හැක) අනුව සකස් කරන ලද අයදුම්පත්‍රය 2023.08.18 දිනට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු අතර ලියුම් කවරයේ වම් කෙළවර ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති, සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම, නො. 53, රත්නායක මාවත, පැලවත්ත, බත්තරමුල්ල**